# අධ්‍යාපන ප්‍රතිභා 10

## கல்வி ஒளி





**උපදේශන සංස්කාරක**

මහාචාර්ය ආනන්ද ජයවර්ධන

**සංස්කාරක**

ප්‍රබෝධිනී රාජපක්ෂ



අධ්‍යාපනවේදී කලා සංසදය
අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය - 2018

**(06)**

# ලාංකේය ශිෂ්‍ය දේශපාලනය තුළ විශ්වවිද්‍යාල ශිෂ්‍යාවගේ කාර්යභාරය

## කොළඹ විශ්ව විද්‍යාලය ඇසුරිනි

*උදාරි පේරුසිංහ, පශ්චාත් උපාධි අපේක්ෂිකා, සමාජ විද්‍යා අධ්‍යයනාංශය*
*මොහමඩ් මහීස්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (සමාජ විද්‍යා), ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය අනුශාසක,*
*කොළඹ විශ්වවිද්‍යාලය.*

### හැඳින්වීම

ඕනෑම සමාජයක සමාජ ආර්ථික හා දේශපාලන ක්‍රියාවලිය තුළ ශිෂ්‍ය දේශපාලනය එම සමාජයෙහි ධනාත්මක මෙන්ම සෘණාත්මක වශයෙන් බලපෑම් කරමින් තිබේ. ලාංකේය සමාජයට මෙන්ම අධ්‍යයන පද්ධතියට ශිෂ්‍ය දේශපාලනය දැඩි ලෙසබලපෑම් කිරීම හඳුනාගත හැකිය. ශිෂ්‍ය දේශපාලනය යනු හුදෙක්ම බාහිර පක්ෂ දේශපාලනය හා බද්ධ වූ ක්‍රියාකාරකම් නොව අධ්‍යාපනයට අදාළ ඕනෑම බල සම්බන්ධතාවයක් හෝ එම ධූරාවලියක් ශිෂ්‍ය දේශපාලනය ලෙස හඳුනාගත හැකි තත්වයක් වේ.

බොහෝ දුරට ශිෂ්‍ය දේශපාලනය යනු පීඨ මට්ටමින් පවතින ශිෂ්‍ය සංගම්වල ක්‍රියාකාරීත්වය හෝ මහාශිෂ්‍ය සංගමය හෝ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරීත්වය ලෙසට ප්‍රසිද්ධියට පත්ව ඇත. විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන





සියලුම ආකාරයේ බල සම්බන්ධතාවන් ශිෂ්‍ය දේශපාලනයට අයත් වේ. සිසුන් විසින් පවත්වාගෙන යන නොයෙක් සමිති, සංගම් හා සමාජ ව්‍යාපාර ශිෂ්‍ය දේශපාලනයට අයත් වේ. නිදසුනක් ලෙස ග්‍රාමීය සිසුන් නියෝජනය කරන ශිෂ්‍ය සංගම් ද, නාගරික සිසුන් නියෝජනය කරන ශිෂ්‍ය සංගම්ද, ආගමික හා අධ්‍යාපන වශයෙන් පිහිටුවා ඇති සංගම්ද මේ ගණයට අයත් වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ 2015/2016 දත්තයන්ට අනුව වර්තමානයේ සිසුන් 80000 කට ආසන්න පිරිසක් විවිධ විශ්වවිද්‍යාලවල හා අධ්‍යාපන පීඨවල අධ්‍යාපනය ලබන අතර ඔවුන්ගෙන් 65% කට අධික පිරිසක් ශිෂ්‍යයන් වේ. ශාස්ත්‍රහා නීති පීඨවල 85% ක් ශිෂ්‍යාවන් වීම විශේෂ තත්වයකි. වර්තමාන ප්‍රවණතාවය අනුව විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍යාවන්ගේ ප්‍රමාණය වාර්ෂිකව සියලු පාඨමාලාවල හා පීඨවල ඉහළ යන තත්වයක් දක්නට ලැබේ. නමුත් විශ්වවිද්‍යාල තුළ ක්‍රියාත්මක වන ශිෂ්‍ය දේශපාලන කටයුතුවල වැඩි වශයෙන් හා සක්‍රියව කටයුතු කරන්නේ ශිෂ්‍යයන්ය.

මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වන්නේ ශිෂ්‍ය දේශපාලනයේ පවතින ස්ත්‍රී පුරුෂ භාවය විශ්ලේෂණය කිරීමයි. එනම් වර්තමාන ලාංකේය ශිෂ්‍ය දේශපාලනයේ විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන්ගේ කාර්යභාරය සමාජ විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීමයි. මෙම ලිපිය සම්පාදනය කිරීමෙහිලා ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයක් මුල්කොට ගත් දත්ත රැස්කිරීමක්ද සාහිත්‍ය විමර්ශනයක්ද සිදුකරන ලදි. ඒ සඳහා නියදිය වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපීඨය තෝරා ගන්නා ලදි. දත්ත රැස්කිරීමේ ප්‍රධාන ශිල්ප ක්‍රම වශයෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදි.ගුණාත්මක දත්ත රැස්කිරීමේ පරමාර්ථයෙන් සම්මුඛ සාකච්ඡා 20ක් අරමුණු සහගත නියදිය මුල් කරගෙන කාලවකවානුන් කිහිපයක් නියෝජනය වන පරිදි තෝරා ගන්නා ලදි. මෙම දත්ත සංකල්ප හා තේමා පදනම් කරගෙන සමාජ විද්‍යාවේ පර්යාවලෝක තුළින් ගුණාත්මක ලෙස විශ්ලේෂණය කරන ලදි.

ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය තුළ විශ්වවිද්‍යාල ශිෂ්‍යාවගේ කාර්යභාරය පිළිබඳ අධ්‍යයනයේදී ශිෂ්‍යාවන්ගේ ශිෂ්‍ය ව්‍යාපාර සඳහා සහභාගීත්වය අවම වීම පිළිබඳ සමාජ සංස්කෘතික වශයෙන් විමර්ශනය කිරීම තුළදී ශිෂ්‍යාවන් හා ශිෂ්‍ය සංගම්

සාමාජිකත්වය පිළිබඳ සොයා බලන ලදි. මෙහිදී සම්ප්‍රදායික ශිෂ්‍ය සංගම් හරහා සිදුවන තත්වයන් හා නවීන ජනප්‍රිය තරුණ දේශපාලන සංගම් හා සන්සන්දනය කිරීමේදී හඳුනාගත හැකි වූ කාරණාවන් වූයේ එම පද්ධතීන්හි පවත්නා සම්ප්‍රදායන් තුළින් ශිෂ්‍යාවන් දේශපාලනීහරණය හෝ දේශපාලනීකෘත වීමේ හැකියාව ලබනු ඇති බවයි. දකුණු ආසියානු සංස්කෘතියට ආවේනික වූ සම්ප්‍රදායික පුරුෂාධිපත්‍යයේ බලපෑම (Basu, 2005) වර්තමාන විශ්වවිද්‍යාල පද්ධතියේ ද හඳුනාගත හැකිවිය. මේ අනුව ස්ත්‍රිය යනු දුර්වල ප්‍රජාවක්ය යන හැඟීමක් ඒ අනුව ශිෂ්‍යයන් කටයුතු කිරීම සිදු වන බව සම්ප්‍රදායික ශිෂ්‍ය ව්‍යාපාර තුළ හඳුනාගත හැකි වූ අතර නූතන තරුණ, ජනප්‍රිය තලයට අයත් රොට්රැක් (Rotaract) වැනි සංවිධාන මෙම තත්වය නොවන බවත් හඳුනාගත හැකිවිය. ශිෂ්‍යාවන් හා ප්‍රාදේශීකත්වය අනුව හඳුනා ගැනීමේදී ශිෂ්‍ය ව්‍යාපාරයන් සඳහා ක්‍රියාකාරීත්වය ලබා දීමේදී ග්‍රාමීය පිරිස තුළ වඩා පසුගාමී බව නිරීක්ෂණයවිය. එම තත්වය සම්ප්‍රදායන්, අත්දැකීම් ආදිය සමග ගොඩනැගුණුබව හඳුනාගත හැකි විය. පාසල් පසුබිම ද පවුල් පසුබිමද ශිෂ්‍යාවන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් තීරණය කරන්නාවූ සාධකයන් වන බව හඳුනාගන්නා ලදි. පවතින අධ්‍යාපන ක්‍රමයෙහි ඇති තරඟකාරීත්වය තුළ ශිෂ්‍යාවන් තම අනාගත රැකියා අර්බුදය පිළිබඳ විමසිලිමත් වෙමින් තරඟකාරීව අධ්‍යාපන කාර්යයේ යෙදීමත් දේශපාලනය හුදු කාලය වැයවන ක්‍රියාවක් වශයෙන් නිගමනය කිරීමත් හඳුනාගත හැකි විය. මේ අනුව 70 හා 80 දශකයේ බුද්ධිමය හා මතවාදයන් පෝෂණය කරනු ලැබූ අධ්‍යාපන ක්‍රමයම වර්තමානයේ මතවාද රහිත මෙන්ම දැනුමින් සපිරි නමුත් බුද්ධිමය හා දේශපාලන සවිඥාණිකත්වය විරහිත දේශපාලන සංස්කෘතියක් ශිෂ්‍යාවන් කරා ලබා දී ඇති බවද හඳුනාගත හැකිය. කොළඹ විශ්වවිද්‍යාලය අවට පවත්නා පරිභෝජනවාදී සංස්කෘතිය මගින් ශිෂ්‍යාවන් තුළ විලාසිතා, සන්නිවේදනය, නව ප්‍රවණතාවන්, තාක්ෂණය, විනෝදය ආදිය ඇතුලත් ඊට යටත් වන ජීවියකු ගොඩනගා ඇත.

## ශිෂ්‍ය දේශපාලනයේ ආරම්භය හා විකාශනය

ලාංකේය ශිෂ්‍ය දේශපාලනය ලාංකේය සමාජ සන්දර්භය තුළ අද්විතීය ස්ථානයක් හිමි කරගත් ක්ෂේත්‍රයකි. ලෝකයේ





විශ්වවිද්‍යාල පද්ධතිය ආරම්භ වී වසර දහසකට ආසන්න කාලයක් ගතවී ඇති අතර වර්තමානය වන විට විශ්වවිද්‍යාල පද්ධතිය ප්‍රබල ස්ථානයකට පත්ව ඇත. ක්‍රමිකව විශ්වවිද්‍යාල පද්ධතියේ භෞතික සංකල්පය වර්ධනය වීමත් එයට සමානුපාතිකව විද්‍යාර්ථීන්ගේ සමාජ, ආර්ථික, දේශපාලනික චින්තන විෂය ධාරාවන්ද විප්ලවීය ලෙස වර්ධනය වූ ආකාරයත් ජාත්‍යන්තර හා දේශීය විශ්වවිද්‍යාල පද්ධතීන්හි ඓතිහාසික තත්වයන් සන්සන්දනය කර බැලීම තුළින් පැහැදිලි වන්නකි.

ලාංකීය සමාජ පද්ධතිය තුළ හඳුන්වා දෙනු ලැබූ 1833 කෝල්බෲක් කැමරන් දේශපාලනික යෝජනා අනුව ආරම්භ වූ ආර්ථික විප්ලවයත් සමඟ 1870 කොළඹ විශ්වවිද්‍යාලය ආරම්භ වී 1921 විශ්වවිද්‍යාල කොලීජිය ආරම්භ කිරීම අතීතයේ සුවිශේෂී සන්දිස්ථානයක් වේ. විශ්වවිද්‍යාල පද්ධතියේ ප්‍රගමනයත් සමඟින් සිදුවූ ආකල්ප හා බුද්ධිමය වර්ධනය 1971 කැරැල්ල, 1980 විප්ලවය, 1988 හා 1989 කාල පරිච්ඡේදයේ ඇතිවූ කැරළි තුළින් විද්‍යාමාන වීම සිදුවේ (වික්‍රමරත්න, 2006).

කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ව්‍යාපාරයන් පිළිබඳ සුවිශේෂී අවධානය යොමු කිරීමේදී 1970, 1980 හා 1990න් පසු අවධිය පිළිබඳ විමර්ශනය කිරීමේදී කාලීනව වෙනස්වීම් සිදුවූ බව හඳුනාගත හැකිය. අයිවන් (2012)ට අනුව දක්වන්නේ මතුපිට අරුතින් හඳුනා ගැනීමේදී ඉතා සරල ක්‍රමෝපායන් ලෙස දක්නට ලැබිය හැකි දේශපාලනික ක්‍රියාකාරකම් සරල තත්වයේ සිට ජාතික දේශපාලන ව්‍යුහය දක්වා ගෙනයෑම ශිෂ්‍ය ව්‍යාපාරයන් තුළින් සිදුවූ බවයි. මේ අනුව ශිෂ්‍ය ව්‍යාපාරය වූ කලී බුද්ධිමය හා මතවාදයන් නිරන්තරයෙන් ගැටෙන්නාවූ සුවිශේෂී, බලපෑම් සහගත වූත් ව්‍යාපාරයක් වන බව හඳුනා ගත හැකිය.

සම්මුඛ සාකච්ඡාවල දැක්වූ අදහස්වලට අනුව, ලෝකයේ සුවිශේෂී සිදුවීම්, බලපෑම් සහගත සිදුවීම් ඇති කළ හැකි ප්‍රබල ස්ථානයක් හිමි කර ගෙන ඇති ශිෂ්‍ය ව්‍යාපාරයන්හි සංයුතිය පිළිබඳ හඳුනා ගැනීමේදී ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන්ගේ සංයුතීන් පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත. මතුපිට අරුතින් නිරීක්ෂණය කිරීමේදී ශිෂ්‍ය ව්‍යාපාරයන්හිදී බොහෝ විට ක්‍රියාශීලී වන්නේ ශිෂ්‍යයන් වේ. ශිෂ්‍යයාවන්ගේ ප්‍රතිශතයෙහි යම්

ඌනතාවක් ජාතික දේශපාලනයේදී මෙන්ම ශිෂ්‍ය ව්‍යාපාරයන් තුළ ද හඳුනාගත හැකි කාරණාවක් වේ. මෙම සංසිද්ධිය පිළිබඳ ඓතිහාසික තත්වයන් පිළිබඳ විමර්ශනය කිරීමේදී 70 හා 80 දශකයේ ශිෂ්‍ය ව්‍යාපාරයන් තුළ ශිෂ්‍යාවන්ගේ සංයුතිය යම් ප්‍රමාණයක් පැවතියද 90දශකයෙන් පසු අවධිය තුළ එය ඉතාම මන්දගාමී තත්වයේ පැවතීම හඳුනාගත හැකිය. වර්තමාන විශ්වවිද්‍යාල සංයුතිය පිළිබඳ හඳුනා ගැනීමේ දී 90%වන ශිෂ්‍යාවන් ප්‍රතිශතයේ කාර්යභාරය ඉතා ඉහළ විය යුතු වුවද දේශපාලන කාර්යභාරයේ ඌණ සහභාගීත්ව සංසිද්ධිය සඳහා හේතු සහගත වන කාරණාවන් හඳුනා ගැනීම වඩා වැදගත් හා කාලීන විෂය පථයක් වනු ඇත. මේ අනුව මෙම ලිපිය තුළින් ප්‍රධාන වශයෙන් සාකච්ඡා වන්නේ ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය තුළකොළඹ විශ්වවිද්‍යාල ශිෂ්‍යාවගේ කාර්යභාරය පිළිබඳව වේ.

## කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය දේශපාලනය

1950 දශකයේ සිට කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ව්‍යාපාරයන්හි ක්‍රියාකාරකම් හඳුනාගත හැකි අතර 1953 දී ශිෂ්‍ය ශිෂ්‍යයාවන් හර්තාල ව්‍යාපාරයත් සමගින් ඉතා විශාල වශයෙන් නැගී සිටින්නට විය. විශ්වවිද්‍යාල ප්‍රජාව දැඩි ආර්ථික අර්බුදතාවන් හමුවේ කම්කරුවන් හා එකතු වී ක්‍රියාකාරීත්වයේ යෙදෙන්නට විය. 1950 වන විට ශිෂ්‍ය ව්‍යාපාරයන්ගේ ක්‍රියාශීලීත්වය සඳහා හේතු සහගත වන්නේ 1940 ආරම්භ වූ නිදහස් අධ්‍යාපනය හා මධ්‍ය විද්‍යාල ක්‍රමය බිහිවීම තුළිනි. මෙම කාලසීමාව විපුල හේවාමුණි දක්වන්නේ රන්මාලු පොකුණට වෙල්මාලු පැමිණීම ලෙසිනි (ළමා හේවා, 2012).

1960 දශකයේ ජ. වි. පෙ. පක්ෂය පහළ වීමත් සමගම ශිෂ්‍ය ව්‍යාපාරයන් සඳහා මතවාදීමය පෝෂණයන් ලැබුණු අතර මූලික වශයෙන්ම දැඩිලෙස පීඩනයට පත් පිරිස් රැඩිකල් දේශපාලන ව්‍යාපාර සඳහා පැමිණීම හඳුනාගත හැකිය. මෙම කාල සීමාව තුළ ද වඩා විශාල වශයෙන් අවධානය යොමු කරනු ලැබුයේ දේශප්‍රේමීත්වයේ පදනම මත කම්කරු පන්තිය ඒකරාශී කරමින් රාජ්‍ය තන්ත්‍රයක් නිර්මාණය කිරීම මිස මෙහි කාන්තා සහභාගීත්වය පිළිබඳ සෙවීම නොවේ. මේ අනුව මෙම කාල සීමාව පිළිබඳ හඳුනාගැනීමේදී කාන්තා දේශපාලන තත්වය ඉතා අවම මට්ටමක සිදුවී ඇති බව හඳුනාගත හැකිය.





- **1980 දශකය**

සම්මුඛ සාකච්ඡා තොරතුරුවලට අනුව, 1980වසර වන විට කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සභාව ජ. වි. පෙ. පාලනය යටතට ගනු ලැබුවද සියලු ශිෂ්‍ය අරගලයන්හිනායකත්වය ස්වාධීන ශිෂ්‍ය සංගමය ලබා ගනී. 1984- 1985 යුගයන් පිළිබඳ හඳුනාගැනීමේදී කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යාවන්ගේ යම් පිබිදීමක් හඳුනාගත හැකි අතර ශිෂ්‍යයන් විසින් පවත්වනු ලබන වසර හමුව (batch meeting), පීය හමුව ආදිය සඳහා කාන්තා සහභාගීත්වය හා යම් යම් අවස්ථාවන්හි ගොඩනැගුණු ශිෂ්‍ය ව්‍යාපාරයන් සඳහා කාන්තා දායකත්වයන් යම් ප්‍රමාණයකින් වූ බව හඳුනාගත හැකිය. මෙම දශකය තුළ ශිෂ්‍ය දේශපාලනයේ ක්‍රියාශීලීන් විසින් ශිෂ්‍යාවන් ඇමතීමත් ඔවුන් හා සන්නිවේදනය සඳහාත් විශ්වවිද්‍යාල පාලනාධිකාරියේ අවසරයන් ඉල්ලා ගනිමින් ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාර කරා පැමිණීම සිදු කර ඇති බව හඳුනාගත හැකිය. මෙම තත්වය තුළින් පැහැදිලි වන්නේ එම දශකය තුළ විශ්වවිද්‍යාලය තුළ හඳුනාගත හැකි වූ මතවාදීමය හා බුද්ධිමය අභිප්‍රේරණයම ශිෂ්‍යාවන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් වර්ධනයට හේතු සහගත වූ බවයි. මෙම කාල සීමාව තුළ ක්‍රියාශීලී කාන්තාවන් වශයෙන් අනෝමා පීනාදරී, තිසරණී ගුණසේකර ආදීන් වැදගත් වේ.

- **1990 දශකය**

සමස්ථයක් වශයෙන් ශිෂ්‍ය දේශපාලන ව්‍යාපාරයන් පිළිබඳ විමර්ශනය කිරීමේදී හඳුනාගත හැකි වන්නේ 1990න් පසු යුගය මතවාදයන්ගෙන් අවම වන බවයි. 1970, 1980 කාලසීමාවන්හි වූ තත්වයන් තුළින් අරගලයන්ට මැදිහත් වූ පිරිස් හා එම අත්දැකීම්වලට ලක්වූ පාසල් සිසුන් විශ්වවිද්‍යාලයට පැමිණ සිදු කරනු ලැබූ මතවාදීමය අවධිය නිමාවීම මෙම දශකයේදී වේ. මෙම තත්වය විශ්ලේෂණය කරමින් දේවසිරි (2011) දක්වන්නේ මතවාදයන්ගෙන් පිරි පිරිස් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරීමෙන් පසු විශ්ව විද්‍යාලයේ මතවාදීමය යුගය නිමා වන්නාවූ බවයි.

කොළඹ විශ්වවිද්‍යාලයේ කාන්තා දේශපාලන ව්‍යාපාරයන් පිළිබඳ හඳුනා ගැනීමේදී මෙම කාලසීමාව තුළ කාන්තා

දේශපාලන ක්‍රියාකාරකම් ඉතාම අවම මට්ටමට පැමිණීම හඳුනාගත හැකිය. සම්මුඛ සාකච්ඡාවලට අනුව 1994 ජනතා විමුක්ති පෙරමුණු රජය දේශපාලන ව්‍යාපාර හා සම්බන්ධ වී චන්ද්‍රිකා රජය දිනවීමට ක්‍රියාකිරීමේදී විශාල වශයෙන් සහයෝගය ලබා දී ඇත්තේ ශිෂ්‍ය නායකයන් වේ. 1998-2000 කාල සීමාව තුළ කොළඹ විශ්වවිද්‍යාලයේ කිත්‍යාකර නේවාසිකාගාරය හා තෙලවල පිහිටි නේවාසිකාගාරයන් ඉතා තරගකාරීව ශිෂ්‍ය දේශපාලන කටයුතු සිදු කිරීමේදි කාන්තා දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳ සඳහන් වන්නේ නැත. 2001 කාල සීමාව තුළ බලයට පැමිණි එක්සත් ශිෂ්‍ය සංගමය ආණ්ඩුව හා සමගාමීව කටයුතු කරන අවස්ථාවන්හිදී හෝ 2002 දී බලයට පැමිණි පොදු ශිෂ්‍ය සංගමය ආණ්ඩු විරෝධීව හා පරිපාලනය විරෝධීව කටයුතු කරන අවස්ථාවන්හිදීත් කාන්තා දේශපාලන ක්‍රියාකාරීත්වය පිළිබඳ සුවිශේෂී ඉතිහාසයක් ගොඩනැගී නැත. 2006 වසර වන විට තෙලවල නේවාසිකාගාරයට සිසුන් කණ්ඩායම් දෙකක් ඇතුළත් කිරීමෙන් ඇතිවූ ගැටලු සහගත අවස්ථාවන්හිදී ශිෂ්‍යාවන් පෙළ නොගැසුණි. 2007 වසරේදී විශ්වවිද්‍යාලයට ශිෂ්‍ය ගැටුම් හා ප්‍රචණ්ඩත්වය හේතුවෙන් පොලිස් ආරක්ෂාව ප්‍රථම වරට ලබා දීමේදීද ශිෂ්‍යාවන් ඉතා ආරක්ෂිත පිරිසක් ලෙස සිටින ලදි. ශිෂ්‍ය සංවිධානය බලයට පත්වීමේදීත්, බල රහිත වීමේදීත්, නේවාසිකාගාර අතර ගැටුම් ඇතිවීමේදීත්, ආණ්ඩු හිතවත් හා ආණ්ඩු විරෝධී වීමේදීත්, පරිපාලන හිතවත් හා පරිපාලන විරෝධී වීමේදීත් විශ්වවිද්‍යාල ශිෂ්‍යයා ප්‍රමුඛව සිටින අතර ශිෂ්‍යාව ආරක්ෂා කළ යුතු කොට්ඨාසයක් වන්නේ ඇයි ද යන්න උභතෝකෝටිකයකි. විශ්වවිද්‍යාලය යනු විශ්වීය දැනුම සපයන විද්‍යාර්ථීන් පිරිසක් වීමත්, සමානාත්මතාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ස්ත්‍රීවාදය හි සමාජවාදය, රැඩිකල්භාවය ආදී සංකල්ප විවරණය කරන ස්ථානයක මෙවන් තත්වයක් ඇති වන්නේ ඇයිද යන්න විමර්ශනය කළ යුතු තත්වයක් වේ. මේ අනුව ශිෂ්‍ය ව්‍යාපාරයන්හිදී ශිෂ්‍යාවන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය සඳහා බලපානු ලබන සමාජ හා සංස්කෘතික කාරණාවන් හඳුනාගැනීමද වැදගත් වනු ඇත.





කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ව්‍යාපාරයන්හි දී ශිෂ්‍යාවන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය සඳහා බලපානු ලබන සමාජ හා සංස්කෘතික කාරණාවන් හඳුනාගනිමින් ශිෂ්‍ය ව්‍යාපාර තුළ කාන්තාවගේ කාර්යභාරය පිළිබඳ සාකච්ජා කිරීමට එම පීඨවල ස්ත්‍රී පුරුෂ සංයුතිය හඳුනා ගැනීම වැදගත් වේ.

## විශ්වවිද්‍යාලයේ 2015 වසරේ පීඨ සංයුතිය

වගු අංක 1- විශ්වවිද්‍යාලයේ 2015 පීඨ සංයුතිය

| පීඨය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|
| කලා | 419 | 2023 (82%) | 2442 |
| විද්‍යා | 775 | 866 (52%) | 1641 |
| වෛද්‍ය | 543 | 620 (54%) | 1163 |
| කළමණාකරණ | 711 | 1069 (60%) | 1780 |
| නීති | 171 | 932 (84%) | 1103 |
| අධ්‍යාපන | 04 | 238 (98%) | 242 |
| UCSC | 467 | 304 (39%) | 771 |
| ශ්‍රී පාලී | 110 | 513 (82%) | 623 |
| IIM | 169 | 572 (72%) | 741 |
| එකතුව | 3369 | 6579 (68%) | 10506 |

(විශ්ව විද්‍යාල පාලන වාර්තා, 2015)

ඉහත වගුගත කිරීමට අනුව සමාජයීය විද්‍යා විද්‍යාර්ථීන් වශයෙන් කලා පීඨයේ 82% ක පිරිසක් ද, නීති පීඨයේ 84%ක් ද, අධ්‍යාපන පීඨයේ 98%ක්ද ශිෂ්‍යාවන් වේ. ස්වභාවික විද්‍යා විද්‍යාර්ථීන් වශයෙන් ශිෂ්‍යාවන් හඳුනාගැනීමේදී විද්‍යා පීඨයේ 52%ක්ද, වෛද්‍ය පීඨයේ 53%ක් ද, කළමනාකරණ පීඨයේ 60% ක් ද වශයෙන් ශිෂ්‍යයන්ට සමානව සිටීම හඳුනාගත හැකිය. නමුත් මෙම බහුතරයක් පිරිස තුළින් ශිෂ්‍ය ව්‍යාපාරයන්හි, ශිෂ්‍ය දේශපාලනයේ යෙදෙන ප්‍රමාණයන් අවම වීම සිදුවේ. යම් දේශපාලන පද්ධතියක දේශපාලනය සිදු නොකිරීමද එක්තරා දේශපාලන ක්‍රියාවලියක් වුවද මෙම සංසිද්ධිය එසේ නොවන බව

සම්මුඛ සාකච්ඡා නිරීක්ෂණයන් තුළින් හඳුනාගත හැකි විය. මෙම තත්වය මනාව හඳුනාගැනීම සඳහා ශිෂ්‍ය සංගම් හා ශිෂ්‍යාවන්ගේ ක්‍රියාකාරීත්වයන් පිළිබඳ විමර්ශනය කිරීම වැදගත් වනු ඇත.

- **ශිෂ්‍යාවන් හා ශිෂ්‍ය සංගම් සාමාජිකත්වය**

කොළඹ විශ්වවිද්‍යාලය තුළ ශාස්ත්‍ර, නීති පීඨවල 85% කට වැඩි පිරිසක් ශිෂ්‍යාවන් වුවත් ඔවුන් එම පීඨවල ශිෂ්‍ය සංගම්වල අඩු නියෝජනයක් පෙන්නුම් කරයි. එය පහත සඳහන් වගුවෙන් පැහැදිලි වේ.

වගු අංක 2 - 2011-2016 වර්ෂයන්හි ශිෂ්‍ය සංගමයේ ශිෂ්‍යාවන් නිලතල දැරූ ආකාරය

| වර්ෂය | ශිෂ්‍ය නියෝජනය | ශිෂ්‍යාවන් නියෝජනය | ප්‍රතිශතයක් වශයෙන් | නිලතල |
|---|---|---|---|---|
| 2011 | 10 | 2 | 2.5% | කාරක සභික |
| 2012 | 7 | 5 | 41.8% | කාරක සභික |
| 2013 | 7 | 5 | 41.8% | කාරක සභික |
| 2014 | 7 | 5 | 41.8% | කාරක සභික |
| 2015 | 5 | 7 | 41.8%* | උපලේකම්, කාරක සභික |

(ක්ෂේත්‍ර පර්යේෂණ දත්ත, 2016)

වගු අංක 2 ට අනුව 2011 ශිෂ්‍ය සංගමයේ නිලතල ලබා ගැනීම් කර ඇත්තේ ශිෂ්‍යාවන් 2ක් පමණි. එම නියෝජනයද කාරක සභික වේ. 2012 දී ශිෂ්‍යාවන් ප්‍රතිශතය 5ක් වුව ද එම තත්වයද ප්‍රතිශතයක් වශයෙන් 41.8% කි. 2015 වසර පිළිබඳ හඳුනාගැනීමේදී මෙම ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගෙන ඒමට එවකට පැවති ශිෂ්‍ය සංගම් කටයුතු කර ඇති බව හඳුනාගත හැකිය. එහිදී උප ලේකම් තනතුර සඳහා ශිෂ්‍යාවක පත්වීම වැදගත්ය. නමුත් මෙම තත්වය ශිෂ්‍යාවන්ගේ ප්‍රතිශතය හා සැසඳීමේදී හඳුනාගත හැකි වන්නේද එම ධූරයද හුදු නියෝජනයක් පමණක්ම වන බවයි. සම්ප්‍රදායික ශිෂ්‍ය සංගමයක් වශයෙන් හඳුනාගත හැකි ශිෂ්‍ය සංගම්හි ස්වභාවය එසේ වන





අතර තරුණ ශිෂ්‍ය ව්‍යාපාරයක් වශයෙන් සැළකිය හැකි රොට්රැක් සංගමයේ (Rotaract Club) පත්වීම් පිළිබඳ විමර්ශනය කිරීමේදී හඳුනාගත හැකි වන්නේ, ශිෂ්‍යාවන්ගේ ප්‍රතිශතයට අදාළව එහි නිලතල හා පත්කිරීම් සිදුවන බවයි.

**වගු අංක 3 - රොට්රැක් සංවිධානයේ නිලතල හා ශිෂ්‍යාවන්ගේ තත්වය**

| වර්ෂය | ධූරය | ස්ත්‍රී, පුරුෂ භාවය |
|---|---|---|
| 2010 -2012 | සභාපති | පුරුෂ |
| 2012 -2013 | සභාපති | ස්ත්‍රී |
| 2014 -2016 | සභාපති | ස්ත්‍රී |
| 2017 -2019 | සභාපති | ස්ත්‍රී |

ජාත්‍යන්තරව ව්‍යාප්ත වූ සංගමයක් වශයෙන් හඳුනාගත හැකි මෙම සංගමයේ මූලාරම්භයේ පමණක් ශිෂ්‍යයකු සිටීමත් පසුව ශිෂ්‍යාවන් විසින් එහි ශිෂ්‍ය ප්‍රතිශතයට සමගාමීව නායකත්වය හැසිරවීම හඳුනාගත හැකිය. මේ අනුව හඳුනාගත හැකි වන්නේ ජනප්‍රිය හා තරුණ සංගමයක් වශයෙන් රොට්රැක් සංගමය තුළ සාම්ප්‍රදායික ශිෂ්‍ය සංගම් අභිභවා යමින් විවිධ කටයුතුවල නිරත වන බවයි. මේ අනුව හඳුනාගත හැකි වන්නේ ශිෂ්‍යාවන්ගේ දේශපාලන භූමිකාවෙහිලා ශිෂ්‍ය සංගම්හි ස්වභාවය හේතු සහගත වන බවයි. අද වන විට නොයෙක් විෂයයන්, සංස්කෘතීන් හා භාෂාවන් මුල් කොටගත් තරුණ ශිෂ්‍ය සංගම් තුළ (Isack Club, Hindu Society, Sinhala Society) ශිෂ්‍යාවන් වැඩි ක්‍රියාකාරී කොටසක් වේ.

- **ශිෂ්‍යාවන් හා සාම්ප්‍රදායික ආකල්ප**

නූතනත්වය උරගා බලනු ලබන ස්ථානයක් වශයෙන් හඳුනාගත හැකි කොළඹ විශ්වවිද්‍යාලයේ කාන්තා දේශපාලන ස්වරූපය තීරණය කිරීමෙහිලා ශිෂ්‍යාවන්ගේ සාම්ප්‍රදායක ආකල්පයන්ද වක්‍රව විශාල බලපෑමක් සිදු කරන බව හඳුනාගත හැකිය. Gunawardhana(2014) පැහැදිලි කරනු ලබන්නේ කාන්තාවන්ට සමාන අයිතීන් දේශපාලනයේදී ලබා දෙනු ලැබුවද මානව අයිතීන් ආදී සියලු දේ පිළිබඳ සැලකිලිමත් වුවද

සංස්කෘතිය තුළින් ලබා දී ඇති ආකල්පයන් තුළ කාන්තා දේශපාලන සහභාගීත්වය අවම වන බවයි. විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය තුළ ස්ත්‍රීවාදයහි විවිධ පැතිකඩයන් පිළිබඳ සාකච්ජා කරනු ලැබුවද එම තත්වයන් සිද්ධාන්තයන්ට පමණක් සීමාවී ඇති බව හඳුනාගැනීමට හැකි වන්නේ ශිෂ්‍යාවන් තුළ සාම්ප්‍රදායික ආකල්පයන් වර්තමානය තුළ ද ඇති නිසාවෙනි. දේශපාලන ක්‍රියාවන් වූ කලී ශිෂ්‍යයන්ට උරුම කාර්යභාරයක් වන අතර දේශපාලන ක්‍රියාකාරකම් සඳහා සහය වීම තමා සතු යුතුකමකි යන මතයේ සිට ශිෂ්‍යයාවන් කටයුතු කරනු ලබන අවස්ථාවන් හඳුනාගත හැකිය. "සමාජය පිළි නොගත් සාම්ප්‍රදායට පටහැනි කරුණක් නම් ඇය සමාජ සාම්ප්‍රදායට පටහැනිව කටයුතු කරන ස්ත්‍රියක් ලෙස කටයුතු කිරීමේ ලේබලය තමන් වෙත පනවා ගැනීමට ස්ත්‍රීහු අකමැතිය" (Gunawardhana, 2014). මේ අනුව හඳුනාගත හැකි වන්නේ කාන්තාවන් මෙම සමාජ සම්මතය ආරක්ෂා කරනු ලබන බවයි. ලාංකේය දේශපාලනය තුළ ශිෂ්‍යාවන් විසින් නිරන්තරයෙන් ශිෂ්‍ය ව්‍යාපාරයන්හි පසුපෙළසිටම දක්නට ලැබේ. මෙම තත්වය ඇති කිරීමෙහිලා සමාජානුයෝජනයේ කාර්යභාරය ද හේතු සහගත වන බව පැහැදිලිය. විමලධර්ම (2003) දක්වන්නේ කාන්තාවට කුඩා කල සිටම ලබා දෙනු ලබන සමාජානුයෝජනයේ ප්‍රතිඵලයක් වශයෙන් ළමාභාවය හා වැඩිහිටිභාවය තීරණය වන බවයි. මේ අනුව හඳුනාගත හැකි වන්නේ ශිෂ්‍ය ව්‍යාපාරයන්හි දී ශිෂ්‍යාවන්ගේ භූමිකාව අවම වීමට සාම්ප්‍රදායික ආකල්පයන් හේතු සහගත වන බවයි.

වර්තමාන ශිෂ්‍ය සංගම්හි නියෝජනයන් පිළිබඳ හඳුනාගැනීමේදී ඒ පිළිබඳ සම්මුඛ සාකච්ජාවලින් ලබා ගන්නා ලද අදහස වන්නේ ශිෂ්‍ය සංගම්හි නියෝජනයන් හුදු නියෝජනයක්ම පමණක් වන බවයි. වීරසිංහ (1990) දක්වන්නේ කාන්තාව ලොව පුරා පීඩාවට ලක්වන ජන කොටසක් වශයෙනි. නමුත් මෙම තත්වය එලෙසම ලංකාවේ ශිෂ්‍ය දේශාපාලනයට ඇතුළත් කිරීම කළ නොහැකි වුව ද එහි යම් ප්‍රමාණයක සත්‍යභාවයක් ඇති බව හඳුනාගත හැකිය. වීරමුණ්ඩ (2008)අදහස් දක්වන්නේද මෙම සංස්කෘතික කාරණාවන් අධ්‍යාපන ක්‍රමය තුළ ඇති බවත් ඒ තුළින් පුරුෂයන් නවකවදය





ක්‍රියාත්මක කිරීමත්, ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක කිරීමත් හඳුනාගත හැකි බවයි. හේරත් (2015) දක්වන ලෙස පුරුෂාධිපත්‍ය යන සමාජ ව්‍යුහයත්, විවිධ විශ්වාසයන්, අගනාකම් හා අකල්පයන්, මිත්‍යාවන් ආදිය තුළින් දේශපාලන ව්‍යුහය තීරණය වන බවයි.

- **ප්‍රාදේශිකත්වය හා අත්දැකීම්**

මෙයින් පෙනීයන්නේ කොළඹ විශ්වවිද්‍යාලය තුළ ද වෙනත් විශ්වවිද්‍යාලවල මෙන්ම ශිෂ්‍ය දේශපාලනය, නවකවදය හා ප්‍රචණ්ඩත්වය පදනම් කරගත් සරසවි උප සංස්කෘතිය තුළින් කාන්තාවන්ගේ දේශපාලනය සීමා කර ඇති බවයි. ප්‍රදීප් (2003) අනුව විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය දේශපාලනය තීරණය වීමෙහිලා ග්‍රාමීය බව හා නාගරිකත්වය බලපෑම් කරනු ලැබේ. මේ අනුව ශිෂ්‍යාවන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය තීරණය කිරීමෙහිලාද මෙම සංකල්පය ප්‍රතිවිරුද්ධ ලෙස හේතු සහගත වීම හඳුනාගත හැකිය. පෙර පර්යේෂණයන්ට අනුව ග්‍රාමීය පසුබිමින් විශ්වවිද්‍යාලයට පැමිණෙන ශිෂ්‍යයන් ශිෂ්‍ය ව්‍යාපාරයන්හිදී විශාල වශයෙන් ක්‍රියාශීලි වුව ශිෂ්‍යාවන් පිළිබඳ හඳුනා ගැනීමේදී ග්‍රාමීය ශිෂ්‍යාවන් ශිෂ්‍ය දේශපාලනයේ සුවිශේෂී භූමිකාවන්ට පැමිණීමෙහි අවම බවක් තරුණ ජනප්‍රිය ව්‍යාපාරයක් වශයෙන් හඳුනාගත හැකි රොට්රැක් සංවිධානයේ ශිෂ්‍යාවන්ගේ ක්‍රියාකාරීත්වය අනුව හඳුනාගත හැකිය. ලියනගේ,වළාකුලුගේ (2006) අනුව දක්වන්නේ ස්ත්‍රිය කායික මෙන්ම මානසික දුර්වල, අහිංසක, මෘදු, මොලොක්, තවත් කෙනෙකුගේ රැකවරණය ඇතිව සිටිය යුතුය යන්න යම් යම් වෙනස්වීම්වලට ලක් වෙමින් සිටියද තවමත් බහුතරයක් සමාජවල පියා ගෘහ මූලික හා පවුලේ ආදායම් ලබන්නා ලෙස මව සාමාජිකයින් රැක බලා ගන්නා ලෙස භූමිකාවන් සකස් වී ඇති බවයි. මේ අනුව ග්‍රාමීය සංස්කෘතීන් තුළින් පැමිණෙන ශිෂ්‍යාවන් මෙම ක්‍රමයට අනුවර්තනය වී තිබීමත් අනුව ශිෂ්‍ය දේශපාලනයේදී අවම ක්‍රියාකාරීත්වයක් පෙන්වීම හෝ ශිෂ්‍ය දේශපාලනයේ සහභාගී නොවීම හඳුනාගත හැකිය. නමුත් නාගරික ප්‍රදේශයන් තුළින් පැමිණි ශිෂ්‍යාවන් තුළ මෙම ආකල්ප අවම බව හඳුනාගත හැකිය. මේ අනුව ශිෂ්‍යාවන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය තීරණය කිරීමෙහිලා හඳුනාගත හැකි වන්නේ ප්‍රාදේශීයවාදයද බලපෑම් සහගත වන බවයි.

- **අත්දැකීම් අවම වීම**

පවතින දේශපාලන ව්‍යුහය තුළ පවත්නා තත්වයන් තමාට ආරෝපණය කර නොගැනීම් තුළින්ද ශිෂ්‍යාවන් ශිෂ්‍ය දේශපාලන ක්‍රියාකාරකම්හි යෙදීම අවම වීම හඳුනාගත හැකිය. අත්දැකීම් අවම බව පැහැදිලි කරමින් තමා විසින්ම තමා ආන්තීකරණය කර ගැනීම ශිෂ්‍යාවන් විසින් සිදු කරගනු ලබන තත්වයකි. ජාතික දේශපාලනය පිළිබඳ විමර්ශනය කරමින් මෙම තත්වය පැහැදිලි කරනු ලබන විචාරක අදහසක් නම්, "පිරිමින් වූ තමනුත් බොහෝ අමාරුවෙන් නොයෙක් දුෂ්කරතා විඳගෙන මෙහි රැඳී සිටින අතර කාන්තාව සම්බන්ධයෙන් තත්වය වඩා අසතුටුදායක වේ (පල්ලියගුරු, 2009). මේ අනුව මෙම තත්වය ශිෂ්‍ය දේශපාලනයේදීද පවතින ක්‍රමයේ රැඳීසිටීමට අවශ්‍ය කායික, මානසික හා සමාජයීය හුරුව හා අත්දැකීම් වඩා වැදගත් වන බව හඳුනාගත හැකිය.

**අධ්‍යාපන ක්‍රමය හා සංස්කෘතිය**

Samaranayaka(2015) ට අනුව වෙනස්වන ශිෂ්‍ය දේශපාලනය පිළිබඳ පැහැදිලි කරනු ලබන අතර එහිදී අධ්‍යාපනය ක්‍රමය ද හේතු සාධක වන බව දක්වනු ලැබේ. මේ අනුව ශිෂ්‍ය දේශපාලනයේදී ශිෂ්‍ය නායකයින් ජාතික දේශපාලනයේ පක්ෂ සම්බන්ධතාවන් පවත්වා ගැනීම හඳුනාගත හැකිය. තරුණ අසහනය නිසාවෙන් විවිධ ප්‍රචණ්ඩකාරී තත්වයන් ඇති කර ගනු ලබන්නේය. ශිෂ්‍යාවන්ගේ දේශපාලනය පිළිබඳ හඳුනාගැනීමේ දී මෙම තත්වය මත ශිෂ්‍යාවන් වැඩි වැඩියෙන් තම අධ්‍යාපන අවශ්‍යතාවන් කෙරේ යොමු වීම හඳුනාගත හැකිය. සම්මුඛ සාකච්ඡාවන් අනුව ශිෂ්‍ය දේශපාලනය වූ කලී කාලය කා දැමීමක්ය යන අදහස දක්වා මෙම අධ්‍යාපනය ක්‍රමයේ තරගකාරීත්වය වර්ධනය වී ඇති බව හඳුනාගත හැකිය(සිල්වා, 2013). ඒ අනුව නව මාක්ස්වාදී විග්‍රහයට අනුව මිනිසා ධනවාදී ආර්ථිකය හා බැඳුණු පෞද්ගලීකරණය අගය කරනු ලබන්නකි. මේ සඳහා පහසුම මාර්ගය වන්නේ අධ්‍යාපනය වේ යන්න දක්වයි. ශිෂ්‍යාවන් උඩුකුරු චලනතාව සඳහා යොමු වන බව හඳුනාගත හැකිය. මේ අනුව දීර්ඝ වශයෙන් දේශන ශාලා, අමතර කියවීම් හා පුස්තකාලයන්හි ශිෂ්‍යාවන් කාලය ගත කරනු ලබන අතර ශිෂ්‍ය ව්‍යාපාර සඳහා සහභාගී වීම අවම වේ. මෙම





තත්වය පිළිබඳසිරිසේන (2006)දක්වන්නේ විශ්වවිද්‍යාලයන්හි පවත්නා අධ්‍යාපනික කාරණාවන්ද එහි ස්වභාවයන්ද දේශපාලනීහරණය සඳහා හේතු සාදක වන බවයි. මේ අනුව අධ්‍යාපන ක්‍රමයේ පවතින තරගකාරීත්වය තුළ විශාල වශයෙන් ශිෂ්‍යාවන් අධ්‍යාපනයට යොමු වීම තුළින් දේශපාලනීහරණය වී ඇති බව හඳුනාගත හැකිය.

විශ්වවිද්‍යාලය අවට ඇති පරිභෝජනවාදී සංස්කෘතියද වක්‍ර ආකාරයෙන් ශිෂ්‍ය දේශපාලනය කරා ශිෂ්‍යාවන්ගේ පෙළඹවීම අවම වීමට හේතු සහගත වී ඇත. විශ්වවිද්‍යාලය අවට ඇති විවිධ පරිභෝජනවාදී සංස්කෘතීන්, විලාසිතාවන්, නව ප්‍රවණතාවන් පිළිබඳ උනන්දුවීම් විශාල වශයෙන් ශිෂ්‍යාවන් අතර පැතිර පවතී. **නිදර්ශනයක් ලෙස වසර හමුවක් සඳහා ඉදිරිපත් වීමට වඩා පිරිසක් මනාල ප්‍රදර්ශනයක් නැරඹීම සඳහා යෑමත්, විවිධාකාර වශයෙන් ඇති නවීන විලාසිතාවන් සහිත වෙළඳ සැල්හි කාලය ගත කිරීමත් හඳුනාගත හැකිය.** මේ අනුව පැහැදිලි වන්නේසංස්කෘතික කර්මාන්තය නිෂ්පාදනය හරහා පුද්ගලයන්ව සතුටු කරනු ලබන අතර එම සත්‍යයට ප්‍රතිවිරුද්ධව යමින් පුද්ගලයන් තුළ එයට විරෝධයක් ඇති නොවන ආකාරයේ තෘප්තිමත් බවක් ලබා දෙමින් දේශපාලනික ලෙස උදාසීන පිරිසක් බවට පත් කරනු ලබන මිනිසා අතර විශ්වවිද්‍යාල ශිෂ්‍යයා ප්‍රධාන ස්ථානයක් ගනු ලබන බවයි.

නාගරිකත්වය සමගින් පිහිටා ඇති කොළඹ විශ්වවිද්‍යාලයේ පරිභෝජනවාදී සමාජය හා නිරන්තරයෙන් ගැටීම තුළ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට වඩා ශිෂ්‍යයාවන් එම සංස්කෘතිය තුළ අතරමං වීම හඳුනාගත හැකිය. Gane (1991) පින් බෝඩ්‍රියාඩ්ගේ අදහසට අනුව ධනේෂ්වර ජීවන පසුබිමට අනුව යථාර්ථයට හා අධියථාර්ථයට හසු වූවන් පරිභෝජනවාදී සමාජයේ කටයුතු කරනු ලබන්නේය. වයස් පරාසයන් අනුව හා යම් නිදහසක් සොයා යන්නට කැමති පිරිස් බොහෝ විට තම අරමුණු හෝ වගකීම් පිළිබඳ නොසිතා සංස්කෘතිය පිළිබඳ සිතන පිරිසක් බවට පත්වීම හඳුනාගත හැකිය. මේ නිසා තම අයිතීන් උල්ලංඝණය වීම, තම පරම්පරාවේ අනාගතයන් හෝ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයාගේ දේශපාලනික කාර්යභාරය පිළිබඳ නොසිතා සංස්කෘතියේ වහලුන් ලෙස කටයුතු කිරීම හඳුනාගත

හැකිය. මේ අනුව ශිෂ්‍යාවන් දේශපාලනීහරණය වීම හඳුනාගත හැකිය.

ලාංකේය සමාජය තුළ පවතින්නා වූ විශ්වවිද්‍යාල එක්තරා ආකාරයකට ජනවාර්ගීකරණය වී ඇති අතර එම නිසාම ශිෂ්‍ය දේශපාලනයට ද ජනවාර්ගිකත්වය බලපෑම් කොට ඇත. කැලණිය, යාපනය හා අපරදිග විශ්වවිද්‍යාලයන්හි ශිෂ්‍ය දේශපාලනය දෙස බලන විට මෙය පැහැදිලිව අවබෝධ වේ. ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍ය ව්‍යාපාරවල ප්‍රධාන වශයෙන් සිංහල සිසුන් නිරත වන අතර ද්‍රවිඩ හා මුස්ලිම් සිසුන් වෙනම ජනවර්ගය හෝ ආගම පදනම් කොට ගත් සමිති සමාගම් පවත්වාගෙන යන බවත් පැහැදිලි වේ. නමුත් එම සමිති සමාගම්වල ද ප්‍රධාන බලතල තිලයන් දරන්නේ ශිෂ්‍යයන්ය.

## නිගමනය

ලාංකේය ශිෂ්‍ය දේශපාලනය අවබෝධ කරගැනීමෙහිලා දේශපාලන විද්‍යාව, දේශපාලන සමාජ විද්‍යාව හා ස්ත්‍රීවාදී පර්යාවලෝකයන් වැදගත් වේ. ලාංකේය සමාජයේ පමණක් නොව ලෝක දේශපාලනය තුළ ද විශ්වවිද්‍යාලවල ශිෂ්‍ය බල සම්බන්ධතාව හෝ බලධූරාවලිය තීරණාත්මක සාධකයක් බවට පත්ව ඇත. විශ්වවිද්‍යාලවල ඉතිහාසය විශ්ලේෂණය කිරීම තුළින් මෙය අවබෝධ කර ගත හැකිය. ලාංකේය ශිෂ්‍ය දේශපාලනය සඳහා අධ්‍යාපනය පිළිබද රාජ්‍ය ප්‍රතිපත්තිය මෙන්ම බාහිර දේශපාලන පක්ෂ ද ප්‍රබල බලපෑමක් සිදු කර ඇත. වර්තමානය වන විට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ සිසුන් 80000ක් පමණ උසස් අධ්‍යාපනය හදාරන අතර එයින් බහුතරයක් ශිෂ්‍යාවන් වේ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ දේශපාලනය විශ්වවිද්‍යාලවලට මෙන්ම සාමාන්‍ය සමාජවලට ධනාත්මක හා සෘණාත්මක ලෙස බලපෑම් කරමින් සිටී.

විශ්වවිද්‍යාල ශිෂ්‍ය දේශපාලනය විශ්ලේෂණය කිරීම සඳහා දේශපාලන සමාජානුයෝජනය සහ දේශපාලන සහභාගීත්වය අවබෝධ කර ගත යුතුය. මෙම අධ්‍යයනයට අනුව දේශපාලන සහභාගීත්වයේ මුහුණුවරයන් දෙකක් ඇත. එනම් සෘණ ශිෂ්‍ය දේශපාලනය (Hard Politics) හා මෘදු ශිෂ්‍ය දේශපාලනය(Soft Politics) වේ. මේ අනුව විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්





සෘණ ශිෂ්‍ය දේශපාලනය හා ශිෂ්‍යාවන් මෘදු ශිෂ්‍ය දේශපාලනයෙහි යෙදෙනු ලැබීම හඳුනාගත හැකිය. ශිෂ්‍යයන්ගේ දේශපාලනය පිළිබඳ හඳුනාගැනීමේ දී ශිෂ්‍යයන් ක්‍රියාශීලී හා ප්‍රචණ්ඩ වීමත් ශිෂ්‍යාවන් නිහඬ දේශපාලනයක (silent politics) යෙදීමත් හඳුනාගත හැකිය. මේ අනුව ජාතික දේශපාලනයේ දී හඳුනාගත හැකි ස්වභාවයේදී මෙන් කාන්තාවන් නිහඬව නමුත් ප්‍රබල බලපෑමක් ජාතික දේශපාලනයේදී සිදු කිරීම කරන්නාක් මෙන් ශිෂ්‍ය දේශපාලනයේදී නිහඬ දේශපාලනයක් ශිෂ්‍යාවන් විසින් ද සිදු කරනු ලබන බව හඳුනාගත හැකිය.

විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය දේශපාලනය තුළදී ශිෂ්‍යාවන්ගේ පවුල් පසුබිම් පිළිබඳ හඳුනාගැනීමේදී නාගරික ශිෂ්‍යාවන් සංවිධානගත වී විවිධ දේශපාලන ක්‍රියාවන්හි යෙදීමත් ග්‍රාමීය ශිෂ්‍යාවන්ගේ නිහඬ දේශපාලනයත්, පාසල් පසුබිම් පිළිබද හඳුනාගැනීමේදී ඉහළ නාගරික පාසල් පසුබිම් තුළින් විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වූ ශිෂ්‍යාවන්ගේ ක්‍රියාශීලී ස්වභාවයත් මහා විද්‍යාල, මධ්‍යමහා විද්‍යාලයන් හා ග්‍රාමීයව පැමිණි ශිෂ්‍යාවන්ගේ නිහඬ දේශපාලනයත් හඳුනාගත හැකිය. ජනවාර්ගිකත්වය පිළිබඳ හඳුනාගැනීමේදී ශිෂ්‍යාවන් විවිධ ජනවාර්ගිකත්වයන් අනුව දේශපාලනයේ යෙදෙනු හඳුනාගත හැකිය. සිංහල ජනවර්ගය පිළිබඳ හඳුනාගැනීමේදී සිංහල ශිෂ්‍යාවන් යම් ආකාරයක දේශපාලනයකනිරත වුවද මුස්ලිම් හා ද්‍රවිඩ ශිෂ්‍යාවන් සිංහල ශිෂ්‍යාවන්ට සාපේක්ෂව විශාල වශයෙන් බහිෂ්කරණයට ලක්වී තිබීම හඳුනාගත හැකිය. මේ අනුව ජනවාර්ගිකත්වය ආදී කාරණාවන්ද ජාතික දේශපාලනයේ දී මෙන්ම බලපෑම් කරනු හඳුනාගත හැකිය.

විශ්වවිද්‍යාල ශිෂ්‍ය දේශපාලනය තුළ ශිෂ්‍යාවන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය පිළිබඳ විමර්ශනයේදී ධනාත්මක ක්‍රියාකාරීත්වයන් සඳහා යෝජනාවන් වශයෙන් ජාතික දේශපාලන ප්‍රවාහය තුළ මෑතකදී හඳුන්වා දෙන ලද කාන්තාවන් වෙනුවෙන් යම් කෝටා ක්‍රමයක් ලබා දීම ශිෂ්‍ය දේශපාලනයේදී වැදගත් වනු ඇත. මෙය නීතිමය වශයෙන් ශිෂ්‍ය සංගම් ව්‍යවස්ථාවක් තුළින් ලබා ගත හැකි තත්වයකි. මේ අනුව අවසානයේ නිගමනය කළ හැකි වන්නේ ජාතික දේශපාලනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය තත්වයන් ශිෂ්‍ය දේශපාලනය තුළදීද හේතු සහගත වන අතර එම

ලක්ෂණයන්ම අඩු වැඩි වශයෙන් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය දේශපාලනය තුළ හඳුනාගත හැකි බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අයිවන්ල්වික්ටර්. (1986).නූතනකැරළිකාරයින්ගේ සමාජ පසුබිම .කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

(1979). හැත්තෑ එකේ කැරැල්ල .කොළඹ : එස් ගොඩගේ සහ සහෝදරයෝ.

(2015). දේශපාලනයේ පවුල හා කුලය. මහරගම: රාවය ප්‍රකාශකයෝ.

දේවසිරි, නිර්මාල්. (2011). එදයා පතිරණ ජීවිතය හා කාලය ප්‍රේමකුමාර ද සිල්වා, නිර්මාල් රංජිත් දේවසිරි, උපුල් ශාන්ත සන්නස්ගල (සංස්.) දයා පතිරණ 39-51 පිටුව, නුගේගොඩ: සන්හිඳ මුද්‍රණ හා ප්‍රකාශන.

ප්‍රදීප්, අනුරුද්ධ. (2003). ග්‍රාමීය සමාජවාදයේ දේශපාලනය. මුදුන්ගොඩ : තරංගා ප්‍රකාශන.

ළමාහේවා, දිප්ති.(2011). එස්වාධීන ශිෂ්‍ය ඇරඹුම හා දයා පතිරණ භූමිකාව ප්‍රේමකුමාර ද සිල්වා, නිර්මාල් රංජිත් දේවසිරි, උපුල් ශාන්ත සන්නස්ගල (සංස්.) දයා පතිරණ 39-51 පිටුව, නුගේගොඩ: සන්හිඳ මුද්‍රණ හා ප්‍රකාශන.

වීරසිංහල වියුඩර්. (2011). මාක්ස්වාදී සහ නව මාක්ස්වාදී සංභතික මාධ්‍ය න්‍යාය. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ

Basu, A. (2005). *Women, Political Parties and Social Movements in South Asia.* Unites Nations Research institute for Social Development..

Goetz, A. M. (2003). *Women's education and political participation.* United Nations Educational, Sciencetific and Cultural Organization.







Gunawardhana N.S, (2014). *Women in SriLanka: achievements and challenges.Inauguration of the Annual Scientific Sessions* (pp. 4-25). Collage of Community Physicians of Sri Lanka.

Samaranayaka, G. (2015). *Changing university student politics in Sri Lanka: from Oriented to Value oriented student movements. Social affairs: A journal for social Sciences*, 24-32.

Michael Gane. (1991). *Baudrillard's Bestiary: Baudrillard and Culture*. London: Routledge.

Weeramunda, A. (2008). *Socio political impact of student violence and indiscipline in universities and tertiary education institutes.* National Education Commission.

Wimalasuriya Darshani . (2013). *Sri Lankan Universities Falling a Part.* (2014-05-12) Colombo. Gazette.HTTP//www.colombogazette.com.